## අතු කැබලි සිටුවීම

- මව් ශාකයෙන් කපා ගත් අතු පර්ව දෙකක් සහිත අතු කැබලි වලට කැපුම් තලය ආනතව සිටින සේ කපා ගන්න.

- පහල පර්වය අසල ඇති අංකුරය හැර අනෙක් කොටස් කපා ඉවත් කරන්න

- ඉහල පර්වය අසළ ඇති අංකුරය හා පත්‍රය හැර අනෙක් කොටස් කපා ඉවත් කරන්න

- පත්‍ර රෝග සඳහා සුදුසු දිලීර නාශකයකින් ග්‍රෑම් 1 ක් ජලය ලීටර් 1 ක දියකර සකස් කරගත් අතු මිනිත්තු 30 ක් පමණ එහි ගිල්වා තබන්න.



දිලීර නාශකයේ බහාලූ අතු කැබලි

- අතු කැබැල්ලේ පහළ මුහුණතෙහි මුල් උත්තේජක හෝමෝනය ගල්වා, පිරවූ බඳුනේ පැන්සලකින් සිදුරක් සාදා අතු කැබැල්ල සිටුවා තද කරන්න.



බඳුනේ සිටවූ පසු

- මෙම අතු සිටවූ බඳුන් ප්‍රොපගේටරයක තබන්න. දින කීපයකට පසු අවශ්‍ය විට පමණක් ජලය යොදන්න.



ප්‍රොපගේටරය තුළ වැඩෙන පැළ

- සති 3-4 කින් පැලය ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්වයට පත්වේ.


ඩී. වීරසේකර (පර්යේෂණ නිලධාරී)
මාෂ හා තෙල් භෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
අඟුණකොලපැලැස්ස


# අතු කැබලි මගින් තුඹ පැළ හදමු






කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි
2010

තුඹ යනු අවුරුද්ද පුරාම වගා කල හැකි හා අවුරුද්ද පුරාම ඵල දරණ බෝගයක් බව ඔබ දැනටමත් දන්නවා. තුඹ බෝගය ස්වභාවිකව වැවෙන්නේ වියළි කලාපයේ ලඳු කැලෑ වල මාස් කන්නයේ වැස්ස ආරම්භ වීමත් සමගයි. ඒ අල, මුල් හා බීජ පැලවීම මගිනි. නමුත් මේ කොටස් වල සුප්තතාවය නැමැති නියමිත කාලයක් පැල නොවී සිටීමේ ගුණය නිසා මේවායින් අවුරුද්ද පුරාම පැල ලබා ගැනීමේ හැකියාවක් නැත. තවද බීජ වලින් පැළ ලබා ගැනීමේදී ගැහැණු හා පිරිමි ශාක සමානව ලැබේ. මෙම ගැහැණු හා පිරිමි වැල් මල් පිපෙන තෙක් හඳුනා ගත නොහැකි නිසා වගා කිරීමේදී ලොකු ගැටළුවකට මුහුණ දීමට ගොවීන්ට සිදු වේ. මේ ගැටළු මගහරවා ගනිමින් ඔබට අවශ්‍ය තරම් පැල අවශ්‍ය වෙලාවට ලබා ගැනීමට අතු කැබලි මගින් පැල නිපදවීම හඳුන්වා දී ඇත.

## අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍යයන්

- සුදුසු අතු කැබලි
- මතුපිට පස්
- පිරිසිදු වැලි
- සුදුසු පාංශු දිලීර නාශකයක්
- පත්‍ර රෝග සඳහා දිලීර නාශකයක්
- මුල් උත්තේජක හෝමෝනයක්
- තියුණු පිහියක්
- සුදුසු බඳුන් වර්ගයක්

## මව් ශාක තෝරා ගැනීම

නියමිත වර්ගයේ ලක්ෂණ ඇති, මල් පිපීමට ආසන්න ඉතා හොඳින් වැඩුණු ගැහැණු හා පිරිමි ශාක මේ සඳහා තෝරා ගන්න.



*තෝරා ගත් මව් ශාක*

## අතු ලබා ගැනීම

තෝරාගත් මව් ශාක වලින් පත්‍ර 10-15 ක් සහිත අග්‍රස්ථ වැල් කැබලි තියුණු පිහිය භාවිතයෙන් කපා ගන්න. මෙය උදේ කාලයේ කලයුතු අතර කපාගත් අතු කැබලි වල පහළ කෙළවර වහාම ජල භාජනයක බහාලන්න.



*ක්ෂේත්‍රයෙන් ලබා ගත් අතු කැබලි*

## බඳුන් මිශ්‍රණය සකස් කිරීම

- මතුපිට පස් හා පිරිසිදු වැලි සල්ලඩයකින් හලා 2 : 1 අනුපාතයට මිශ්‍රකරගන්න.
- සුදුසු පාංශු දිලීර නාශකයකින් ග්‍රෑම් 1 ක් ජලය ලීටර් 1 ක දියකර හොඳින් තෙමෙන සේ සාදාගත් මාධ්‍යයට යොදන්න.
- පාංශු මාධ්‍යය අතින් ගුලිකල විට ඉහිරී නොයන තරමට ජලය එකතු කරමින් සකස්කර ගන්න.
- සුදුසු බඳුන් වලට (උස සෙ.මී.10 හා පළල සෙ.මී.05) මෙම මිශ්‍රණය පුරවා තරමක් තදකර පතුලෙහි කුඩා සිදුරු කීපයක් සාදන්න.